# අපේ පුවත්

Email : devasarana@sltnet.lk Tel : 0372259852

දේවසරණ සංවර්ධන කේන්ද්‍රය : ඊමේල් පුවත් හසුන - සැප්තැම්බර්

## කසල යක්කු

"රාත්‍රී 8.30 ට පමණ කිසියම් පිරිසක් කෑ කෝ ගසමින් සිංදු කියන ශබ්දය ඇසී මම වැව පැන්නුම පැත්තට ගියා. තරුණයින් 10 දෙනෙකු පමණ පිරිසක් එතන වෙරි මතින් නටමින් සිටියා. එකපාරටම ඒ අයගෙන් දෙදෙනෙක් ඒ අසල තිබුණ කසල බඳුන කඩා වැවට තල්ලු කළා. ඒ දිහා බලා හිටපු අනිත් අය කෑ ගගහා උඩ පැන්නා. මට විශාල වේදනාවක් ඇති වුණත් ඔවුන් ගේ හැටි හොඳින් දන්නා නිසා මම විරෝධය පාන්න ගියේ නෑ... "

වැව පැන්නුම අසල පදිංචි කරුවෙකු වූ නිමල් කලකිරීමෙනුත් කණගාටුවෙනුත් සිද්ද වෙච්ච දේ අපට විස්තර කළා.

වැවේ සිරි නරඹන්න එන අපේ ඇත්තො වැව් තාවුල්ලෙ හා ඒ අවට දමා ගොස් තිබූ ප්ලාස්ටික්, පොලිතීන්, බෝතල් මෙන්ම වෙනත් අපද්‍රව්‍ය ලොරි එකහමාරක් අගෝස්තු 24 වෙනිදා තරුණ තරුණියන් 60 දෙනෙක් සම්බන්ධ කර ගනිමින් පවත්වපු ශ්‍රමදානයක් මගින් අපි ඉවත් කළා. ඉන් පසුව තමන් ඉවත් කරන දෑ නියමිත කසල බඳුනට දමන්න යැයි සඳහන් දැන්වීමක් සමඟ කසල බඳුන් දෙකක් අපි ස්ථාන දෙකක තැබුවා. සතියකට වරක් ඒ අපද්‍රව්‍ය ඉවත් කරන්නට ප්‍රාදේශීව සභාව එකඟ වුණා. වැවේ සිරි බලන්න ආපු බොහෝ අය අපේ ඉල්ලීමට ඇහුම්නක් දීලා තිබුණා.

අපි තැබූ කසල බඳුන් දෙකෙන් එකක් කඩා දමා ඇති බැව් ශ්‍රමදානයට සති දෙකකට පසුව එනම් සැප්තැම්බර් 05 වන දින අපිට දැනගන්න ලැබුණා. එතකොටයි ඒ කතාව දැන ගන්න ලැබුණේ.

බතලගොඩ වැව පිරිසිදුව තබා ගනිමින් ආරක්ෂා කර ගැනීම සඳහා ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම්තුමිය, ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, පලාත් පාලන කොමසාරිස්තුමා, වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයේ නිලධාරි මහතුන්, ගොකරැල්ල පොලිස් ස්ථානාධිපතිතුමා හා වැව අවට පදිංචි කරුවන් සම්බන්ධ කර ගනිමින් සැලැස්මක් සකස් කිරීමේ කටයුතු දේවසරණ සංවර්ධන කේන්ද්‍රය දැන් ආරම්භ කරලා තියෙනවා.

**පී ඩී ගුණතිලක**





කුණු කසල - ඔබ තෝරාගන්නේ කුමන ක්‍රමයද?

# බොන්න වතුර දෙන්න



"අපි වතුර ගෙන්නෙ කිලෝ මීටර් දෙකක් විතර පහල තියෙන කන්ද හරහා එන අගලකින්. දැන් එතන වතුර පාරත් අඩුවෙලා. ඒ කන්ද උඩ තියෙන ගස් ටිකත් කපාගෙන අරගෙන ගිහිල්ලා. අපිට වතුර දෙන්ඩවත් ගස් කපන එක නතර කරන්ඩ වත් කවුරුවත් මැදිහත් වෙන්නේ නෑ."

''කුරුණෑගලට මෙච්චර ලංවෙලත් මම හිතුවෙ නෑ කවදාවත් මේ තරම් දුෂ්කර ගම්මාන තියෙනව කියල.'' වලවල් හැරිච්ච අගල් සහිත පාරක දාඩිය දාගෙන ගිහිල්ල කන්ද උඩටම ගියාට පස්සෙ තමයි විමලෙ මෙහෙම කිව්වෙ.

ගම නැගුම මග නැගුම වාගේ කිසිම සංවර්ධන ව්‍යාපෘතික දායකත්වයක් මේ ගමට ලැබිල තිබුනෙ නෑ කියල අපි හැමෝටම හැබැහින් දකින්ඩ පුළුවන් වුණා.

පාරෙ යනකොට සමහර තැන්වල කොන්ක්‍රීට් අතුරල තිබුණා. ඒ වැඩේ කෙරුවෙ ප්‍රාදේශීය සභාවයි, ගමේ කට්ටියයි එකතු වෙලා කියල අපිට කිව්වෙ රොක්කෙව් වත්ත ගමේ උපාලි.

මේ අත්දැකීමට අපි මුහුණ දුන්නෙ අගෝස්තු මාසෙ 12 වෙනිද තිබුණ ශ්‍රමදානයට සහභාගි වෙන්න ගිහිල්ල.

එදා හරිම රස්නෙ දවසක්. ශ්‍රමදානය අතරතුරේදී අපි වතුර ටිකක් බොන්න සුමනාවතී අක්කලගෙ ගෙට ගොඩ වුණා. වතුර පනිට්ටුවක් ගෙනත් තියලා සුමනාවතී අක්ක කිව්ව දැනට ගෙනාපුව තියෙන්නෙ මෙච්චරයි කියලා. අපි ඇහුව ඇයි ඒ කියලා. ''අපි වතුර ගෙන්නෙ කිලෝ මීටර් දෙකක් විතර පහල තියෙන කන්ද හරහා එන අගලකින්. දැන් එතන වතුර පාරත් අඩුවෙලා. ඒ කන්ද උඩ තියෙන ගස් ටිකත් කපාගෙන අරගෙන ගිහිල්ලා. අපිට වතුර දෙන්ඩවත් ගස් කපන එක නතර කරන්ඩ වත් කවුරුවත් මැදිහත් වෙන්නේ නෑ.''

හවස වැඩ ඉවරවෙලා පිහිල්ලට ගිහිල්ල නාගෙන එනකොට අපි දැක්ක සුමනවීර ගෙදර වත්තෙ අඹ පැලයක් හිටවනව. ''පැලයක් හිටවනව ඇරෙන්ඩ වෙන කරන්ඩ දෙයක් අපට නෑ'' කියලා එයා කිව්වා.

# රත්නවල්ලි පරපුරේ අපි...... අක්කර 3/4යි පවුල් 23යි

**අක්කර තුන් කාලක් ඇතුලෙ ගෙවල් 23ක පවුල් 27ක් ජීවත් වෙනවා. ස්ථිර ලිඳක්, සමිති ශාලාවක්, ස්ථිර වැසිකිලි නැතිව ඒ අය ඉන්නෙ හුදෙකලා වෙලා. මම දන්න විදියට තවමත් කිසිම රජයේ නිලධාරියෙක් ගමට එන්නෙ නෑ. ලියුම් දෙන්නෙත් පොතුහැර තියෙන කඩේකට කියල ආරංචියි.**

සැප්තැම්බර් 04 වෙනිදා මම වටගොඩ ගමට ගියේ පාඨක සමාජ රැස්වීමට චමින්දට යන්ඩ අවශ්‍ය වුනු නිසා. එයා තමයි අපිත් වටගොඩත් අතර සම්බන්ධය ගොඩනගන්නෙ. සමිතිය ඉවරවෙනකම් සියඹලා ගහ යට බංකුවේ වාඩි වුණා විතරයි මට ලස්සන බෙර වාදනයක් ඇහුණා. ඉතින් නිකමට වගේ මම ඒ පැත්තට ගියා. එක පැත්තක එක එක ජාතියේ බෙර වර්ග 15 ක් විතර ගොඩ ගහලා තිබුණා. තම්මැට්ටම, අත් රබන්, විරිඳු රබන්, ගැට බෙර, යක් බෙර, උඩැක්කිය, දවුල, කොංගෝව, තබ්ලා, වගේ බෙර වර්ග මඩුවෙ තිබුනා මට මතකයි.

අද වෙනකොට ගමේ 13 දෙනෙක්ම බෙර වර්ග නිෂ්පාදනය කරලා අනුරාධපුරය, පොලොන්නරුව, ගම්පහ, සහ කොළඹ ප්‍රදේශවලට අළෙවි කරන බව මීට පෙර දවසකදී රණසිංහ මාත් එක්ක කියලා තියනවා.

"දැන් අපේ ළමයි ඉස්කෝලෙ යනවා. අනිත් අයගෙන් කරදර අඩුයි. දැන් අපිට බණක් අහන්න, දානයක් දෙන්න, අනුරාධපුරේ පොලොන්නරුවෙ යන්න ඕනෙ නෑ. ගමේ පන්සලට දැන් දානෙ දෙන්න පුළුවන්. හැබැයි එහෙම පිරිස්වලට එන්න හැකියාව ලැබුනෙ පොඩි අඩි පාරක් විදියට තිබුන ගමට එන පාර අපි ගම්මුන් එක්ක එකතුවෙලා හැදුවට පස්සෙයි කියලයි මට හිතෙන්නෙ." කියල නන්දුව මාමා කියනකොට මට අදහගන්ඩ බැරි උණා.

වටගොඩ ඉඳල කෝන්ගහගෙදර ගම්මානය හරහා කොළඹ කුරුණෑගල පාරේ පොතුහැර හංදියට තියෙන්නෙ කිලෝ මීටර් දෙක හමාරක්. කර්මාන්තපුරේ හරහා කටුපිටිය රඹුක්කන පාරේ කෝරලේගෙදර හංදියට තියෙන්නෙ කිලෝ මීටර් එක හමාරයි. අක්කර තුන් කාලක් ඇතුලෙ ගෙවල් 23ක පවුල් 27ක් ජීවත් වෙනවා. ස්ථිර ලිඳක්, සමිති ශාලාවක්, ස්ථිර වැසිකිලි නැතිව ඒ අය ඉන්නෙ හුදෙකලා වෙලා. මම දන්න විදියට තවමත් කිසිම රජයේ නිලධාරියෙක් ගමට එන්නෙ නෑ. ලියුම් දෙන්නෙත් පොතුහැර තියෙන කඩේකට කියල ආරංචියි.

අපේ ආයතනයත් එක්ක ගමේ පන්සලේ හාමුදුරුවන් එකතුවීම නිසා තමයි වටගොඩ අයට බණක් අහන්ඩ, දානයක් දෙන්ඩ ගමේ පන්සලට යන්ඩ පුළුවන් වුණේ. කොන්වෙලා පැත්තකට වෙලා බලන් ඉන්නෙ නැතුව, දායක සභාවට යන්න, සමිති සමාගම්වලට සම්බන්ධ වෙන්න ඉඩකඩ ලැබුණේ.

රත්නවල්ලියගේ පරපුරෙන් පැවත එන වටගොඩ ගම්මුන්ට මම හිතන විදියට ජීවිතය රැකගන්ඩ ඉදල් කොසු බෙරටික හැර වෙන දෙයක් නැහැ. ඒ කටයුතු කරන්නෙත් පාරම්පරික දැනුමෙන් පමණයි. රජයෙන් වරක් ඔවුන්ගේ වෘත්තිය කරගෙන යාම සඳහා ගොඩනැගිල්ලක් ලබා දීමට කටයුතු කළත් ඔවුනගේ අවශ්‍යතාවය සම්පූර්ණ නොවූ බවයි නිහාල්ලා, ගුණරත්නලා, කුසුමලතාල, නන්දුවා මාමලා මා එක්ක කිව්වෙ. එයාලට නව තාක්ෂණික දැනුම, ශිල්පීය ඥාණය තව අවශ්‍යයි කියල මටත් තෙරුණා. වටගොඩ කොසු ඉදල් හැමතැනම කියෙනවා. වටගොඩ දවුල්, තම්මැට්ටම්, යක්බෙර, උඩැක්කිවල හඬ ලංකාව පුරාම ඇහෙනෙවා. ඒත් මට හිතෙන්නේ ඔවුන් ජීවත්වෙන්න නගන හඬ, ඔවුන් සමාජයෙන් කොන්වීම නිසා නගන වේදනාව ඒ බෙර හඬට වඩා තියුණුයි කියලා. ඒත් ඒ හඬ තවම කාටවත් ඇහිල නෑ කියල මට හිතෙනවා.

ආපසු එන්නට චමින්දගෙ බයිසිකලයට නගිනකොට එතන හිටපු සුරේනු සීයා කියපු කථාව තවමත් මගේ හදවතේ දෝංකාර දෙනවා.

''අපට ඕන එක දෙයයි මහත්තයා. අපිත් අනිත් අය වගේම මිනිස්සු කියල මේ සමාජය පිලිගන්නවනං ඒ හොඳටම ඇති."

**තුසිත ජයසුන්දර**





# පල්ලෙකැලේ එළවලු ගොවීන් භූමිතෙලෙන් දැවේ.

''වෙලාවකට අපට හිතෙනව පාරෙ යන ලොරියක් බලෙන් නවත්තල ෂෙඩ් එකට ගිහින් බලෙන් භූමිතෙල් අරන් එන්න. එහෙම ගියාම පොලීසියෙන් වෙඩි තියල අපි කවුරුහරි මැරුණාමවත් අඩුගාණෙ ගොවියගේ මේ ප්‍රශ්නයට විසඳුමක් ලැබෙව්විනෙ..''

බොහොම ආවේගාත්මකව මා එක්ක ඒ විදියට කිව්වෙ පොල්පිතිගම දුම්මිය ගමේ එච්. එම් ධර්මසිරි හේරත් කියන තරුණ ගොවි මහත්මයෙක්. ඔහුගෙ වයස අවුරුදු 31 යි. දෙදරු පියෙක්. ඔහුගෙ ප්‍රධාන වගාව එළවලු ගොවිතැන. බීට්, නෝකෝල්, රාබු, ලොකුලූණු වගේ එළවලු ඔහු වගා කරනවා. දැන් ඔහු මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි දරා ගන්න බැරි තරමට භූමිතෙල් මිල ඉහල යාම. හිටි ගමන්ම ලීටරය රුපියල් 17 කින් මිල ඉහල ගියාම ගොවීන් දරා ගන්නෙ කොහොමද?

ඔහු මා එක්ක මෙහෙමත් කිව්වා. ''මම අක්කර තුනක වගා කරනවා. දවසකට වගාවට වතුර ගහන්න වතුර මැෂින් එකට භූමිතෙල් ලීටර් 12ක් විතර යනවා. ඒ කියන්නෙ දවසකට රුපියල් නව සීයක් වතුර ගහන්න යනවා. දැන් බීට් කිලෝවක් අපෙන් ගන්නෙ රුපියල් දහයට. ඉතිං භූමිතෙල් ලීටරයක් ගන්න බීට් කිලෝ අටක් විතර විකුණන්න ඕන. එහෙම උනාම අපට මොනවද ඉතිරි වෙන්නෙ? මම මගෙ බීට් වගාව කල් පිරෙන්න ඉස්සෙල්ල ගැලෙව්වා. මොකද වතුර ගහන්න සල්ලි නැති නිසා. ඒ නිසා මගෙ අස්වැන්න 50% කින් විතර අඩුවුණා. හාලා වගාවට සූදානම් කරල තිබුන අක්කර තුන්කාලක ඉඩමයි තවානයි මම අතහැරල දැම්මා.

මම ලබන පාර කුඹුරු ඉහින්නෙත් නෑ. මට මගෙ ළමයි දෙන්න ඉස්කෝලෙ ඇරල උගන්නන්නත් සල්ලි නැතිවෙයි. මෙහෙම ගොවිතැන් කරනවට වඩා නිකන් ඉන්න එක හොඳයි. මේ ඉරුදෙණියේ පල්ලෙකැලේ යායේ ගොවි පවුල් 20,000ක් විතර එළවලු වගාවෙන් තමයි ජීවත් වෙන්නෙ. අනිත් අයගෙ ඉරණමත් මගෙ වගේම තමයි. මගෙ ළමයි දෙන්නට කොහොම හරි කන්න දෙන්න ඕන නිසා මම ගොවිතැන නවත්තල ටවුමෙ කුලියට සිමෙන්ති අනන්න යනවා.''

යුද්ධයක් කරන්න රටේ බඩු මිල මෙහෙම ඉහළ දානකොට මේ රටේ මිනිස්සුන්ට ජීවත් වෙන්න ඊටත් වඩා ලොකු යුද්ධයක් කරන්න වෙනව නේද කියල මට හිතෙනවා.

සුනිල් කහගල්ල

# පොහොර දෙන්නේ ඉපනැල්ලට ගහන්නද ?

මම ජීවත් වන්නෙ ඉබ්බාගමුවෙ කිඹුල්වානා ජනපද ව්‍යාපාරෙ හතරෙ ඇලේ ගමේ. ඒකේ කුඹුරු අක්කර හාර දහස් පන්සියයක් විතර තියෙනවා. අපේ කුඹුරුවලට වතුර ලබා දෙන්නෙ කිඹුල්වානා වැවෙන්.

ගිය යල් කන්නයේ පොහොර ලබා ගැනීම අපට බරපතල ප්‍රශ්නයක් වුණා. මට පොහොර ටික ලබාගන්න පස්වතාවක් යන්න වුණා. පළමුවැනි පාර පොහොරවලට පෝරම ගන්න. දෙවන පාර ඒ පෝරම බාර දෙන්න. සමීක්ෂණයක් කරන්න කියලා අපිව කැඳවල තිබුණ නිසා තුන්වෙනි පාරට යන්න වුණා. ඊට පස්සෙ පොහොර වර්ග තුන ගන්න තවත් දෙපාරක් ගියා. මෙතන තිබුණු අනෙක් පුදුමය තමයි මගේ වී බුසලක කුඹුරට ලැබුණෙ පොහොර වර්ග තුනෙන්ම කිලෝ 25ක් පමණක් වීම. මේ පොහොර ටික ගන්නත් උදේ නවයේ ඉඳල හවස හතර දක්වා පෝලිමේ හිටියා.

එතන තිබුණ හැම පොහොර උරයකම උඩ පැත්තෙ කට ඉරිලයි තිබුණේ. මම සමූපකාර කළමනාකාරිණියගෙන් ඇහුව ඒ ඇයි කියල. කිරන්න කටුව ගහනකොට ඉරුණ කියල ඇය කිව්වා. එතන හිටිය කවුරුවත්ම ඒ උත්තරය නම් පිළි ගත්තෙ නෑ. හැබැයි අපේ පොහොර ටිකට කටුව ගහල තියෙන බව නම් හැමෝටම තේරුණා.

අනිත් ලස්සනම කාරණය තමයි අපට මේ මඩ පොහොරයි, යූරියයි හම්බ උනේ ගොයම් වලට වයස මාසයක් විතර ගියාට පස්සෙ වීම. සමහර අයට මුලින්ම ලැබුණෙ යූරියා. එතකොට යූරිය ගහන කාලෙත් පහුවෙලා. ඊට පස්සෙ තමයි මඩ පොහොර ලැබුණෙ. ඔයාල දන්නවනෙ මඩ පොහොර ගහන්නෙ කුඹුර වපුරනකොට කියල. මේක හරියට තණකොළ කන ගොනාට කිරි පොවනවා වගේ වැඩක්.

මේකට කේන්ති ගිය හතර ඇලේ මුදියන්සෙ මාම ඇහැව්ව මහත්තයෝ ඔයිට වඩා නරකද ඉපනැල්ලට ගහන්න පොහොර දුන්නනම් කියලා. ඒ අය කියනව ගබඩා වල පොහොර තිබුනෙ නෑ කියලා. මැල්සිරිපුර ගොවිජන කේන්ද්‍රයේ D.O නෝන කිව්වෙත් ඔය කතාවමයි.

තව සතියකින් විතර මහ කන්නයේ කුඹුරු වැඩ පටන් ගන්නවා. මාස් කන්නනෙදිවත් වගකිව යුත්තො මේ වින්නැහිය ආයෙ නොවෙන්න වග බලා ගන්න ඕනෑ කියල මට හිතෙනවා.